# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2249/50 - 2021 ඔක්තෝබර් මස 16 වැනි සෙනසුරාදා - 2021.10.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### සුරාබදු ආඥාපනත

### අංක 10/2021 දරන සුරාබදු නිවේදනය

ආරක්ෂිත සලකුණු සහ ආරක්ෂිත සලකුණු කළමනාකරණ පද්ධතිය

සංශෝධිත (52 වන අධිකාරය වන) සුරාබදු ආඥාපනතේ 8 වන සහ 30 වන වගන්ති සමඟ කියවිය යුතු 32 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල් අමාත්‍ය, බැසිල් රාජපක්ෂ වන මම, අංක 2241/3 දරන 2021 අගෝස්තු 16 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් අවසන් වරට සංශෝධනය කරන ලද පරිදි, අංක 2216/16 දරන 2021 පෙබරවාරි 25 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද අංක 07/2021 දරන සුරාබදු නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද රීති, පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

3 වන රීතියේ,

(අ) පළමු අතුරු විධානයේ සඳහන් ''2021 ඔක්තෝබර් මස 15 වැනි දිනෙන් පසුව'' යන වචන හා ඉලක්කම් වෙනුවට ''2022 ජනවාරි මස 03 වැනි දිනෙන් පසුව'' යන වචන හා ඉලක්කම් ආදේශ කිරීම, සහ

(ආ) දෙවන අතුරු විධානයේ සඳහන් ''2021 ඔක්තෝබර් මස 01 වැනි දිනට පෙර'' යන වචන හා ඉලක්කම් වෙනුවට ''2022 අප්‍රේල් මස 01 වැනි දිනට පෙර'' යන වචන හා ඉලක්කම් ආදේශ කිරීම.

බැසිල් රාජපක්ෂ,
මුදල් අමාත්‍ය.

2021 ඔක්තෝබර් මස 16 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

10 - 552


1A - PG 5581 — 360 (2021/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*